**වීරකැටිය ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 03 කට අදාළ රු. 10,812,700 ක් වූ මුද්දර ගාස්තු ආදායම්, සමාලෝචිත වර්ෂයට අදාළ රු. 90,850 ක රථවාහන නැවතුම්පොල ගාස්තු සහ රු. 3,300 ක් වූ තොග ශේෂ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ආ) සභාව සතු JCB යන්ත්‍රයේ රු. 4,781,250 ක් වූ පිරිවැය දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) රු. 879,895 ක් වූ වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ණයගැතියන් රු. 249,028 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**
**----------------------------**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 04 ක ශේෂ සහ ඊට අදාළ පොත් පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 77,361,596 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

------------------

i. 2007 වර්ෂයට අදාළව නඩු පවරා තිබුණු රු. 822,420 ක් වූ පොළ බදු මුදල් සහ 2012 වර්ෂයේ සිට අයවිය යුතු එකතුව රු. 28,650 ක් වූ අක්කර බදු මුදල , 2017 ජුනි 27 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු. 1,256,092 ක් හිඟහිට තිබුණි. 2017 ජුනි 27 දිනට වර්ෂ 01 සිට 05 දක්වා වූ කාලයට අයත් හිඟ ශේෂ වල එකතුව රු. 965,796 ක් විය.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

i. දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනෙමින් පවතින රු. 120,100 ක් වූ ගෙවිය යුතු වැටුප් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු. 41,893 ක දායක මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

ii. ගමින් ගමට දොරින් දොරට වැඩසටහන යටතේ 2014 වර්ෂයට අදාළව වැඩ නිම කල කර්මාන්ත 20 ක් සඳහා ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල් එකතුව රු. 2,340,946 ක් විය.

iii. සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම් වල එකතුව රු. 25,638,006 ක් වූ අතර, 2017 ජූලි 31 දිනට එම බැරකම් වල එකතුව රු. 4,132,663 ක් දක්වා අඩු වී තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

එකතුව රු. 10,608,280 ක් වූ ලී බඩු හා සවිකිරීම් වලට අදාළ උපලේඛනය, රු. 2,564,901 ක් වූ ස්ථාවර වත්කම් වලට අදාළ වත්කම් ලේඛනය, රු. 2,069,392 ක් වූ කර්මාන්ත වෙනුවෙන්වූ සියයට 10 ක රැඳවුම් සම්බන්ධව විස්තරාත්මක උපලේඛනය, රු. 120,099 ක් වූ නොගෙවූ වැටුප් හා වේතන වලට අදාළ උපලේඛනය, යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 185 | ප්‍රාදේශීය සභා පොදු ගිණුමේ රු. 5,678,291 ක අතිරික්ත මාසික සාමාන්‍ය ශේෂයක් පැවතියද, එම මුදල් ආයෝජනය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවූ එකතුව රු. 70,884 ක තැන්පතු ශේෂ 04 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 ඔක්තෝබර් 09 දිනැතිඅංකPFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 4.3 (ඉ) වගන්තිය | සේවය අත්හැරගිය සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 236,765 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2014 පෙබරවාරි 24 දිනැති අංක 01/2014 දරන දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය | සේවක ඇප තැන්පතු ගිණුමෙන් අවස්ථා 06 කදී රු. 19,908 ක මුදල් ආපසු ලබා ගැනීමට ඉඩකඩ සලසා දී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 10,773,593 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 5,509,595 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,263,998 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම මුළු පුනරාවර්තන ආදායමින් සියයට 83 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ දෙකෙහි මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද, සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා පුනරාවර්තන වියදම් වල සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ බිල් කළ මුළු පුනරාවර්තන ආදායම රු. මිලියන 22.23 ක් වූ අතර, එයින් රු. මිලියන 15.49 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 70 ක් පමණ විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් වල එකතුව රු. මිලියන 13 ක් වූ අතර, එයින් රු. මිලියන 7.76 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 60 ක් පමණ විය.

**2.3.2 වරිපනම් හා බදු**

ආරම්භක හිඟයෙන් සියයට 19 ක් හා බිල් කිරීම් වලින් සියයට 29 ක් පමණක් අයවීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු. 4,897,419 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. හිඟ බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදු කුලී**

2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර පස්මංහන්දිය කඩ කාමර 04 ක, වලස්මුල්ල පොදු වෙළඳපොල කඩකාමර 09 ක, මුදුන කඩ කාමර 09 ක සහ සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 42 ක්සම්බන්ධයෙන් අදාළ ගිවිසුම් ප්රකාරව කටයුතු කර නොතිබුණි. තවද යටත් පිරිසෙයින් වසර 05 කට වරක් තක්සේරුගත බදු මුදල සංශෝධනය කළයුතු වුවත්, පස්මංහන්දිය කඩ කාමර 04 ක් හා වලස්මුල්ල පොදු වෙළඳ පොළ කඩ කාමර 10 ක් සම්බන්ධයෙන් නව තක්සේරුවක් කර නොතිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 1,184,863 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 997,905 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්ය සාධන ඇගැයීම

------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් මාර්ග ඉදිකිරීම් සඳහා රු. 1,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත්, එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත කරන ලද එකතුව රු. 3,500,000 ක් වූ සභා කර්මාන්ත 02 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ අනුමත කරගෙන තිබුණු රු.මිලියන 06 ක ව්‍යපෘති වලින් රු. 1,930,472 ක ව්‍යාපෘති පමණක් වර්ෂය තුළදී නිමකර තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාර්ග තලන යන්ත්‍රය

------------------------

සභාව සතු මාර්ග තලනය රු.5,600,000 කට වෙන්දේසි කිරීම සඳහා සූදානම් කිරීමෙන් අනතුරුව රු. 406,840ක වියදමක් දරා අළුත්වැඩියා කර තිබුණි. අනතුරුව අවස්ථා දෙකකදී රු.108,000 ක් වැයකර පුවත්පත් දැන්වීම් පලකර තිබූ නමුත්, ඉල්ලුම්කරුවන් ඉදිරිපත්වී නොතිබුණි. පසුව සභාව විසින් ඉහත තක්සේරු මුදල අඩුකර විකිණීම සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා තිබුණු නමුත්, 2017 ජුනි 27 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

-------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් හඳුනාගෙන තිබුණු භාණ්ඩ 22 ක ඌණතාවයන් සම්බන්ධයෙන්වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීම 2017 ජුනි 27 දින වන විටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

(ඇ) වාහන නඩත්තුව හා පරිපාලනය

---------------------------------

සභාව සතු වාහන 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අදාළ වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ඉ) කාර්ය මණ්ඩල කළමනාකරණය
------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලයට අයත් තනතුරුවල 20 දෙනෙකුගේ අතිරික්තයක් සහ පුරප්පාඩු 12 ක් පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ii සභාවේ අනුමත වැඩ ක්ෂේත්‍ර කම්කරු සේවකයින් තිදෙනෙකු ව්‍යාපෘති භාරකරු, බර උපකරණ ක්‍රියාකරු හා රියදුරු යන තනතුරුද, සෞඛ්‍ය කම්කරුවන් 02 දෙනෙකු බර උපකරණ ක්‍රියාකරු සහ රියදුරු යන රාජකාරි වලද යොදවා තිබුණි.

(ඊ) පවරා නොගත් වත්කම්
-------------------------

ප්‍රාදේශීය සභාව විසින් භාවිතයට යොදා ගෙන ඇති ඉඩම් 07 ක සහ සුසාන භූමි 13 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, තවත් සුසාන භූමි 12 ක අයිතිය පවරා ගැනීමට අදාළ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම වී නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**
**-----------------------------------**

2007 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කළ විවිධ වත්කම් 11 ක් ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.4 හඳුනාගත් අලාභ**
**----------------**

වලස්මුල්ල පොදු වෙළඳ පොළ කඩ කාමර 04 ක් අවුරුදු 05 ක් තිස්සේ භාවිතයට යොදවා නොගැනීම නිසා රු. 570,000 ක ආදායම් සභාවට අහිමිවී තිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**
**-------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත මුදල රු. 1,500,000 ක් වූ ගලහිටිය ඥානසාර මාවත කැටගල් ඇල්ලීමේ කර්මාන්තය මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශයකින් තොරව සහා ප්‍රතිපාදන මත රු. 500,000 ක් බැගින් වූ කොටස් 03 කට වෙන්කර ප්‍රදේශයේ අනුමත එක් සමිතියක් සමඟ අවස්ථා 03 කදී ගිවිසුම්ගතව වැඩ ඉටුකරවා ගෙන තිබුණි.

(ආ) ඉහත මාර්ගය කැටගල් අල්ලා සකස් කිරීමේ අදියර තුනේදීම එක් අදියරකට මීටර් 02 බැගින් මාර්ගයේ දිග අඩුවෙන් ඉදිකිරීම නිසා ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු. 47,792 ක් ගෙවා තිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**--------------------------------------**

**4.1** **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වැය විෂයයන් 08 ක රු. 32,750,827 ක් වූ ඉතිරිකිරීම්ද, ආදායම් විෂයයන් 03 ක රු. 36,302,997 ක් වූ අහිතකර විචලනයන් පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාවා ගෙන නොතිබුණි.

**4.2** **අභ්‍යන්තර විගණනය**

**----------------------**

දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/යහ/01/න.ච.ලේ. හා 2014 පෙබරවාරි 24 දිනැති චක්‍රලේඛයෙහි දක්වා ඇති පරිදි සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර තිබුණද, සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. විගණන සැලැස්ම සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**-------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඉ) අයවැය පාලනය